# විගණන සේවා කොමිෂන් සභාව

## කාර්ය සාධන වාර්තාව

## 2018.07.01-2018.09.30

විගණන සේවා කොමිෂන් සභාව

අංක 35 ඒ,

ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත

කොළඹ 08

## දැක්ම

මහජන බැඳියාව සහ වගවීම සඳහා කැප වූ

විශිෂ්ට විගණන සේවයක්

## මෙහෙවර

වෘත්තීයමයභාවය, නිපුණත්වය සහ යහපාලනය පෙරදැරි කර ගත් රාජ්‍ය විගණන සේවයක් ස්ථාපනය කිරීම තුළින් රාජ්‍ය සම්පත් වලට වගවීම සහතික කිරීම

## අපගේ අගයන්

- ස්වාධීනත්වය
- අපක්ෂපාතීත්වය
- අවංක භාවය
- නවෝත්පාදනය
- පාරදෘශ්‍යභාවය
- වගවීම
- වෘත්තීය නිපුණත්වය

# පෙලගැස්ම



| අනු අංකය | කාරණය | පිටුව |
|---|---|---|
| **1.** | හැඳින්වීම | **1** |
| **2.** | විගණන සේවා කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන් | **1-2** |
| 2.1 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (ඇ) ව්‍යවස්ථාව මඟින් පැවරී ඇති බලතල හා කාර්යයන් | **1** |
| 2.2 | 2018.08.01 දින සිට ක්‍රියාත්මක වන 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව පැවරී ඇති බලතල හා කාර්යයන් | **1-2** |
| **3.** | විගණන සේවා කොමිෂන් සභාවේ 2018.07.01 සිට 2018.09.30 දක්වා කාර්ය සාධනය | **2-4** |
| 3.1 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඇ ව්‍යවස්ථාවේ විධි විධාන අනුව පැවරී ඇති බලතල හා කර්තව්‍යයන්හි ප්‍රගතිය | 2 |
| 3.2 | පරිපාලන හා මූල්‍ය ප්‍රගතිය | 3-4 |
| 3.3 | කොමිෂන් සභා රැස්වීම් | 4 |
| **4.** | කාර්ය මණ්ඩලය | **5** |
| 4.1 | කාර්ය මණ්ඩල පුහුණුව | 6 |
| **5.** | ඇමුණුම් | 7-8 |
| | 1. 2018.01.01 සිට 2018.09.30 දක්වා මූල්‍ය වාර්තාව | 7 |
| | 2. විගණන සේවා කොමිෂන් සභාවේ සංවිධාන සටහන | 8 |

# විගණන සේවා කොමිෂන් සභාව

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII වන පරිච්ඡේදයේ 153 අ (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණන සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.

## 2. කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන්

### 2.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (ඇ) ව්‍යවස්ථාව මඟින් පැවරී ඇති බලතල හා කාර්යයන්

I. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින්ගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමේ බලය.

II. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින්ගේ සේවයට බඳවා ගැනීමේ පටිපාටි, පත් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහකිරීම්වලට අදාළ රීති සකස් කිරීම.

III. නීතිය මඟින් ස්ථාපිත ජාතික විගණන සේවයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම.

IV. නීතිය මඟින් සලකනු ලබන පරිදි වූ වෙනත් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීමේ බලය.

### 2.2. 2018.08.01 දින සිට ක්‍රියාත්මක වන 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව පැවරී ඇති බලතල හා කාර්යයන්

**I.** කාර්ය සාධන විගණන, පාරිසරික විගණන, තාක්ෂණික විගණන සහ වෙනත් යම් විශේෂ විගණන සඳහා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල කිසිදු විගණන ප්‍රමිතියක් නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවකදී, එම විගණන සම්බන්ධයෙන් අදාළ විය යුතු බවට උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධානය මඟින් තීරණය කරන ලද ජාත්‍යන්තර ප්‍රමිතිවල ප්‍රතිපාදන, දේශීය අවශ්‍යතාවලට සරිලන පරිදි වූ සංශෝධන සහිතව අදාළ පරිදි සකස් කර ගැසට් පත්‍රයේ පළ කිරීම.

**II.** විගණන කරනු ලබන ආයතනයක යම් ගනුදෙනුවක් යම් ලිඛිත නීතියකට පටහැනිව සිදු කර ඇති බවටත් එම ගනුදෙනුව මඟින් වංචාවක්, නොසැලකිල්ලක්, සාවද්‍ය පරිහරණයක් හෝ දූෂණයක් හේතු කොටගෙන යම් ඌනතාවක් හෝ පාඩුවක්, දූෂණයක්

සිදු වී ඇති බවටත් විශ්වාස කිරීමට සාධාරණ හේතු කොමිෂන් සභාවට පවතින අවස්ථාවේ එම ඌනතාවලට හෝ පාඩුවට හෝ අදාළ වටිනාකම, විගණන සේවා කොමිෂන් සභාව විසින්, අධිභාරයක් පැනවීම සඳහා එම ගනුදෙනුව හේතු කොටගෙන සිදුවූ සැම ඌනතාවකටම හෝ පාඩුවකටම අදාළ වටිනාකම් අදාළ ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත වාර්තා කිරීම.

III. කොමිෂන් සභාවේ කටයුතුවලට සහය වීම සඳහා කමිටු පත් කිරීම.

IV. ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ක්‍රම හඳුන්වා දීම.

V. පනතේ විධිවිධාන සලසා ඇති කරුණු සඳහා රීති සැකසීම.

VI. රාජ්‍ය විගණන පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරණයට අදාළ රීති සකස් කිරීම

## 3. විගණන සේවා කොමිෂන් සභාවේ 2018.07.01 සිට 2018.09.30 දක්වා කාර්ය සාධනය

### 3.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඇ ව්‍යවස්ථාවේ විධි විධාන අනුව පැවරී ඇති බලතල හා කර්තව්‍යන්හි ප්‍රගතිය


| අනු අංකය | බලතල | ප්‍රගතිය |
|---|---|---|
| 1 | ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින්ගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම | I. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා කෙටුම්පතට අදාළව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ, ජාතික වැටුප් කොමිෂන් සභාවේ සහ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ ලබාගෙන එම නිර්දේශ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස විගණකාධිපතිට උපදෙස් ලබා දීම<br><br>II. ජාතික විගණන කාර්යාලයේ නියෝජ්‍ය විගණකාධිපතිවරු දෙදෙනෙක් (02) සේවයෙන් විශ්‍රාම ගැන්වීම සඳහා අනුමැතිය ලබා දීම |
| 2 | ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම | ජාතික විගණන කාර්යාලයේ 2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත සමාලෝචනය කර ගරු කථානායකතුමා වෙත යොමු කිරීම |


### 3.2 පරිපාලන සහ මූල්‍ය ප්‍රගතිය


2018 වර්ෂය වෙනුවෙන් විගණන සේවා කොමිෂන් සභාව සඳහා පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් ලෙස වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් 2018.07.01 සිට 2018.09.30 දක්වා වූ කාර්තුව සඳහා පුනරාවර්තන වියදම් ලෙස රුපියල් 7,115,844.62ක් හා ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් 545,194.32ක් වැය කර ඇත.

**මූල්‍ය ප්‍රගති සාරාංශය - 2018.01.01 සිට 2018.09.30 දක්වා**

| | ප්‍රතිපාදන රු. (2018 වර්ෂය) | මුළු වියදම (2018.01.01-2018.09.30) රු. | ඉතිරිය (2018.09.30 දින වන විට) රු. |
|---|---|---|---|
| පුනරාවර්තන | 44,322,000.00 | 27,974,294.96 | 16,347,705.04 |
| ප්‍රාග්ධන | 1,885,000.00 | 712,674.82 | 1,172,325.18 |
| **එකතුව** | **46,207,000.00** | **28,686,969.78** | **17,520,030.22** |






2018.01.01 සිට 2018.09.30 දක්වා වූ මූල්‍ය වාර්තාව ඇමුණුම 01 හි දක්වා ඇත.

### 3.3 කොමිෂන් සභා රැස්වීම්

2018.07.01 – 2018.09.30 දින දක්වා කාලය තුළ විගණන සේවා කොමිෂන් සභා රැස්වීම් වාර පහක් (05) පවත්වා ඇත.

## 4. කාර්ය මණ්ඩලය

විගණන සේවා කොමිෂන් සභාව සඳහා අනුමත කර ඇති මුළු තනතුරු සංඛ්‍යාව 43කි.

| විගණන සේවා කොමිෂන් සභාවේ අනුමත හා දැනට සේවයේ නියුතුකාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු පිළිබඳ තොරතුරු -2018.09.30 දිනට | | | | |
|---|---|---|---|---|
| **තනතුරේ ස්වභාවය** | **තනතුර** | **අනුමත තනතුරු සංඛ්‍යාව** | **සේවයේ නියුතු සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | ලේකම් | 10 | 02 | 08 |
| | අතිරේක ලේකම් | | | |
| | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | | | |
| | අධ්‍යක්ෂ | | | |
| | සහකාර ලේකම් | | | |
| | සහකාර අධ්‍යක්ෂ | | | |
| | විගණන අධිකාරි | | | |
| | ගණකාධිකාරි | | | |
| | නීති නිලධාරි | | | |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරි | 05 | 02 | 03 |
| | භාෂා පරිවර්තක | | | |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | | | |
| ද්විතීය මට්ටම | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 16 | 09 | 07 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | | | |
| ප්‍රාථමික මට්ටම | රියදුරු | 12 | 9 | 03 |
| | කාර්යාල කාර්ය සහයක | | | |
| **එකතුව** | | **43** | **22** | **21** |

විගණන සේවා කොමිෂන් සභාවේ සංවිධාන සටහන ඇමුණුම 02 හි දක්වා ඇත.

**4.1 කාර්ය මණ්ඩල පුහුණුව**

විගණන සේවා කොමිෂන් සභා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම් වැඩසටහන් යටතේ 2018 තෙවන කාර්තුව තුළ නිලධාරින් පහත දැක්වෙන පරිදි පුහුණු සඳහා යොමු කර ඇත.

| | පුහුණු වැඩසටහනේ නම | තනතුර | නිලධාරින් ගණන |
|---|---|---|---|
| 1 | රජයේ ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව | ගණකාධිකාරී | 01 |
| 2 | කණිෂ්ඨ විධායක නිලධාරීන් සඳහා වන ඉංග්‍රීසි ඩිප්ලෝමාව (රාජ්‍ය කළමනාකරණ සහකාර/ සංවර්ධන නිලධාරී) | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| 3 | රියදුරු කාර්යාභිවර්ධන පාඨමාලාව | රියදුරු | 01 |
| 4 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන්ගේ ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන | ගණකාධිකාරී | 01 |
| 5 | 'ගූගල් සමඟ ඩිජිටල්කරණයෙන් වැඩ පහසු කර ගන්නා ආකාරය' පිළිබඳ පුහුණු වැඩසටහන | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 |
| 6 | සිගාස් පුහුණු වැඩමුළුව | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |


ඇමුණුම 01

විගණන සේවා කොමිෂන් සභාව
මුළු ප්‍රතිපාදන සහ වියදම **2018 -01 -01** දින සිට **2018-09-30** දින දක්වා

| වැය විෂය | විස්තරය | වාර්ෂික ප්‍රතිපාදන වෙන් කිරීම - 2018 රු. | අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීම - 2018 රු. | මු.රෙ. 66 මාරු කිරීම 2018 රු. | අනුමත මුළු ප්‍රතිපාදන වෙන් කිරීම - 2018 රු. | වියදම2018-07-01 සිට 2018-09-30 දක්වා රු. | වියදම2018-01-01 සිට 2018-09-30 දක්වා රු. |
|---|---|---|---|---|---|---|---|
| **23-01-01** | ***පුනරාවර්තන වියදම්*** | **44,322,000.00** | - | - | - | **7,115,844.62** | **27,974,294.96** |
| | පුද්ගල පඩි නඩි | **22,000,000.00** | | | | **3,897,532.65** | **11,423,476.02** |
| 1001 | වැටුප් හා වේතන | 15,000,000.00 | | | | 1,909,891.92 | 5,637,494.32 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,000,000.00 | | | | 21,387.26 | 91,018.35 |
| 1003 | වෙනත් දීමනා | 6,000,000.00 | | | | 1,966,253.47 | 5,694,963.35 |
| | ගමන් වියදම් | **1,100,000.00** | | | | **-** | **2,187,100.50** |
| 1101 | දේශීය | 100,000.00 | | | | - | - |
| 1102 | විදේශීය | 1,000,000.00 | 1,000,000.00 | 200,000.00 | 2,200,000.00 | - | 2,187,100.50 |
| | සැපයුම් | **1,972,000.00** | | | | **209,851.26** | **464,988.03** |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය වියදම් | 1,000,000.00 | | | | 51,450.00 | 57,825.00 |
| 1202 | ඉන්ධන සැපයීම් | 700,000.00 | | | | 118,457.70 | 291,180.30 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 272,000.00 | | | | 39,943.56 | 115,982.73 |
| | නඩත්තු වියදම් | **900,000.00** | | | | **54,774.15** | **340,895.33** |
| 1301 | වාහන නඩත්තු වියදම් | 700,000.00 | | (200,000.00) | 500,000.00 | 17,559.00 | 303,680.18 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | 200,000.00 | | | | 37,215.15 | 37,215.15 |
| | සේවා | **16,950,000.00** | | | | **2,885,423.57** | **13,333,388.27** |
| 1401 | ප්‍රවාහන වියදම් | 1,200,000.00 | | | | 453,750.00 | 1,053,750.00 |
| 1402 | තැපැල් හා සංනිවේදන වියදම් | 1,500,000.00 | | | | 206,143.12 | 576,884.95 |
| 1403 | විදුලිය හා ජල වියදම් | 720,000.00 | | | | 56,899.15 | 197,092.45 |
| 1404 | බදු කුලී හා දේශීය බදු | 10,530,000.00 | | | | 1,636,363.55 | 9,869,318.05 |
| 1409 | වෙනත් වියදම් | 3,000,000.00 | | | | 532,267.75 | 1,636,342.82 |
| | මාරු කිරීම් | **1,400,000.00** | | | | **68,262.99** | **224,446.81** |
| 1505 | සම්මාදම් සහ දායක මුදල් | 100,000.00 | | | | - | - |
| 1506 | රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | 1,300,000.00 | | | | 68,262.99 | 224,446.81 |
| **23-01-01** | ***ප්‍රාග්ධන වියදම්*** | **1,885,000.00** | - | - | - | **545,194.32** | **712,674.82** |
| | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | **400,000.00** | | | | **185,149.32** | **185,149.32** |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 200,000.00 | | | | 185,149.32 | 185,149.32 ★ |
| 2003 | වාහන | 200,000.00 | | | | - | - |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | **1,000,000.00** | | | | **206,545.00** | **253,775.50** |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 1,000,000.00 | | | | 206,545.00 | 253,775.50 |
| | මානව සම්පත් සංවර්ධනය | **485,000.00** | | | | **153,500.00** | **273,750.00** |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 485,000.00 | | | | 153,500.00 | 273,750.00 |
| | මුළු එකතුව | **46,207,000.00** | - | - | - | **7,661,038.94** | **28,686,969.78** |

★ කාර්යාල කාමර වෙන් කිරීම් කටයුතු සඳහා තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන පවරා දී ඇත .
වටිනාකම රු. **185,149.32**

ඇමුණුම 02


විගණන සේවා කොමිෂන් සභාවේ සංවිධාන සටහන
කොමිෂන් සභාව
ලේකම්
අතිරේක ලේකම්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධ්‍යක්ෂ
සහකාර ලේකම්
සහකාර ලේකම්
ගණකාධිකාරී
නීති නිලධාරී
සහකාර අධ්‍යක්ෂ
විගණන අධිකාරී
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
අනෙකුත් කාර්ය මණ්ඩලය
(කාර්යාල කාර්ය සහායක/රියදුරු)